www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා හමුදාවේ තියුනු ෂෙල් ප්‍රහාර මධ්‍යයේ සිවිල් මරන සංඛ්‍යාව ඉහල නැගේ

## Civilian deaths mount amid intense Sri Lankan army shelling

**කේ. රත්නායක විසිනි**
**2009 මාර්තු 7**

දිවයිනේ උතුරේ වන්නි ප්‍රදේශය තුල බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය අල්ලා ගෙන සිටින අවසන් භූමි භාගය මත ශ්‍රී ලංකා හමුදාව එල්ල කරන ප්‍රහාරය දැවැන්ත සිවිල් ජන ඝාතනයක් හා මානුෂීය ව්‍යසනයක් නිර්මානය කරන බවට එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ජාත්‍යන්තර ආධාර ඒජන්සි යලිත් අනතුරු අඟවා ඇත.

බදාදා සහ බ්‍රහස්පතින්දා හමුදාවේ ෂෙල් ප්‍රහාර සිවිල් වැසියන් දුසිම් ගනනාවක් ඝාතනය කල අතර ආන්ඩුව ආහාර සැපයුම් මුලුමනින්ම පාහේ නතර කර ඇති බැවින් යුද කලාපය තුල සාගින්න වැඩෙමින් පවතී. ලෙඩ රෝග වසංගත බවට පත්වීමේ තර්ජනය ද වර්ධනය වෙමින් පවතින අතර වෛද්‍ය පහසුකම් කාලතුවක්කු ප්‍රහාර මගින් විනාශ කරනු ලැබ ඇත.

ප්‍රදේශයට "දිවා රෑ" ෂෙල් ප්‍රහාර එල්ල වන බවත් ආන්ඩුව ප්‍රහාර එල්ල නොකරන බවට පොරොන්දු වී ඇති" යුද මුක්ත කලාපයට" පිටත මෙන් ම එය තුලටත් එම ප්‍රහාර එල්ල කෙරෙන බවත් පුදුමතලාන්හි තාවකාලික රෝහලේ සේවය කරන රජයේ වෛද්‍යවරයකු වන තුරෙයිරාජා වර්ධරාජා *ඇසෝසියේටඩ් ප්‍රෙස් ප්‍රවෘත්ති* සේවයට පැවසීය. බදාදා ෂෙල් ප්‍රහාරවලින් 60 දෙනෙක් ඝාතනයට ලක්ව තවත් 159ක් තුවාල ලැබූ බව ඔහු කීය. බ්‍රහස්පතින්දා තුවාල ලැබූ 94 දෙනෙකු සමග මල සිරුරු 5ක් රෝහලට ගෙන එන ලදි.

සිවිල් ජනගහනයට පිරිසිදු ජල සැපයුමක් හෝ සනීපාරක්ෂක පහසුකම් නොමැති බවත් ඔවුන් පාචනය, පැපොල හා සෙංගමාලය යන රෝග පැතිරයාමේ අවදානමට මුහුන දී සිටින බවත් වර්ධරාජා පැවසීය. ආහාර හිඟකමෙන් අදහස් කෙරෙන්නේ, සමහරු ගස්වල ඇති ආහාරයට ගත නොහැකි කොල වර්ග පවා කෑම අරඹා ඇති බවත් 13 දෙනෙක් පසුගිය සතියේ සාගින්නෙන් මිය ගිය බවත් යයි ඔහු සඳහන් කලේය. එසේ මිය ගියවුන්ගෙන් වැඩි දෙනා මහලු අයය.

බදාදා සහ බ්‍රහස්පතින්දා එල්ල වූ තොරක් නැති ෂෙල් ප්‍රහාරවලට පසුව ආහාර කොල්ලකෑමට පවා තමන්ට බල කෙරී ඇතැයි යුද කලාපය තුල සිටින සිවිල් වැසියෝ පැවසූහ. "දවස් හතරකින් මගේ පවුලෙ අය කෑවෙ නැහැ." යයි 46 හැවිරිදි මේරි ජසින්තා බාලචන්ද්‍රන්, තාවකාලික වෛද්‍ය සායනයක් අසල සිය වාරය එනතෙක් සිටින අතරතුර, *ඇසෝසියේටඩ් ප්‍රෙස්* වෙත දුරකතනයෙන් පැවසුවාය. බ්‍රහස්පතින්දා එල්ල වූ ෂෙල් ප්‍රහාර මගින් තම මස්සිනාගේ බඩේ හටගත් තුවාලයකට හදිසි ශල්‍ය කර්මයක් අවශ්‍යව ඇතැයි ඇය සඳහන් කලාය. "ඒ වුනත් අවශ්‍ය බෙහෙත නැති නිසා එයාව ඔපරේෂන් එකට ගන්න ඩොක්ටර්ස්ලට විධියක් නැහැ." යයි ඇය පැවසුවාය.

ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ (අයිසීආර්සී) දකුනු ආසියානු මෙහෙයුම් ප්‍රධානී ජැක් ඩි මයියෝ, එක්සත් ජාතීන්ගේ *අයිආර්අයිඑන්* ප්‍රවෘත්ති ඒජන්සියට මේ සතියේ දී මෙසේ පැවසීය: "වන්නි කලාපය තුල දිගටම සිදුවන සටන්වලට කොටු වී සිටින සිවිල් ජනතාව සම්බන්ධයෙන් සැලකූ කල, එය නිසැකවම මා දැක ඇති වඩාත්ම ව්‍යසනකාරී තත්වයන්ගෙන් එකක්. ඔවුන් ෂෙල් ප්‍රහාරවලට හා වෙඩි හුවමාරුවලට නිරාවරනය වෙලා. මිනිස්සු මැරෙනවා. ප්‍රදේශයේ ක්‍රියාත්මක වන රෝහල් හෝ වෙනත් වෛද්‍ය පහසුකම් නැහැ."

ප්‍රාදේශීය අයිසීආර්සී කාර්ය මන්ඩල සාමාජිකයකු වූ වඩිවේල් විජයකුමාර්, කාලතුවක්කු ප්‍රහාරයකට ලක්වීමෙන් පසුව. බදාදා තාවකාලික රෝහලක දී මිය ගියේය. ඔහුගේ නව හැවිරිදි පුත්‍රයාට ද එහි දී තුවාල සිදුවිය. අයිසීආර්සී ආරක්ෂාව සහිත නැව් මගින් තුවාල ලැබූ සිවිල් වැසියන් හා ඔවුන්ගේ යැපෙන්නන් රටේ නැගෙනහිර පිහිටි ත්‍රිකුනාමලය රෝහල වෙත ප්‍රවාහනය කිරීමේ කටයුතුවලට ඔහු සහාය දෙමින් සිටියේය.

බදාදා අයිසීආර්සී ත්‍රිකුනාමලය වෙත එලෙස තුවාලකරුවන් හා ඥාතීන් අටවන වතාවටත් ප්‍රවාහනය කිරීම සංවිධානය කලේය. සිවිල් වැසියන්ගෙන් බොහෝ දෙනෙක් උන්ඩ හා බෝම්බ කැබලිවලින් හටගත් තුවාලවලින් පෙලෙමින් සිටියහ. එයින් තහවුරු වූයේ ඔවුන් ෂෙල් ප්‍රහාරවලට ගොදුරුවූවන් බවයි. අයිසීආර්සී ප්‍රථම වතාවට එලෙස ජනයා ප්‍රවාහනය කල පෙබරවාරි 6 දා සිට මේ දක්වා, එය රෝගීන් හා තුවාල ලැබූවන් 2,700කට වඩා ගලවාගෙන ඇතැයි එහි ප්‍රකාශිකා විජේරත්න මාධ්‍යවලට පැවසුවාය.

"කලපුවක් හා නැගෙනහිර සාගර යුද පෙරමුන අතර පිහිටි කුඩා බිම් තීරුවක කොටුවී සිටින සිවිල් වැසියන් ආහාර, හිසට සෙවනක් හා පානීය ජලය නැතිව මංමුලාසහගත තත්වයක සිටින්" බව, ශ්‍රී ලංකාව තුල එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් පිලිබඳ ප්‍රකාශක ගෝර්ඩන් වීස් බදාදා අනතුරු ඇඟවීය. සිවිල් වැසියන්ට ආධාර සැපයුම් කපා හැර තිබීම "පිලිගත නොහැකි" තත්වයක් බව ඔහු පැවසීය. වීස් මෙසේ සටහන් කලේය: "පසුගිය වසරේ දෙසැම්බර් සිට මේ දක්වා අපට කිසිදු ස්ථිරසාර ආහාර සැපයුමක් තිබුනේ නැහැ." ඒ වෙනුවට එහි ලගා වී ඇත්තේ "විටින්විට ලැබෙන ආහාර සැපයුම් පමනි".

අයිසීආර්සී සෞඛ්‍ය සම්බන්ධීකාරකයකු වන මොර්වෙන් මර්චිසන්, පෙබරවාරි 26 දා *අයිආර්අයිඑන්* වෙත දුන් සම්මුඛ සාකච්ඡාවක දී යුද කලාපයේ තත්වය විස්තර කලේය. වෙරලබඩ පුදුමතලාන් ප්‍රදේශයේ මිලිටරිය විසින් වෙන්කර ඇති "යුද මුක්ත කලාපය" තුල ප්‍රමානවත් පානීය ජලය නොමැති නිසා, අවතැන් වූ ජනයා ජලය සොයමින් සටන් පවතින රට ඇතුලත ප්‍රදේශ කරා ආපසු යමින් සිටිති.

යුද සරනගතයන් වෙනුවෙන් වැසිකිලි හෝ වැසිකිලි වලවල් හෝ වෙනත් ආකාරයක සනීපාරක්ෂක පහසුකම් නොමැති බැවින් රෝග පිලිබඳ අවදානම ඉතා ඉහල බව මර්චිසන් පැවසීය. "පාචනය හා ශ්වසන පද්ධතියේ ආසාදන ඇතුලු, බෝවෙන රෝග පිලිබඳ අවස්ථා වැඩි වන බවට වාර්තා වෙනවා. බරපතල ලෙස රෝග පැතිරීමේ හැකියාව ගැන අපි බෙහෙවින් උත්සුකව සිටිනවා."

"යුද මුක්ත කලාපයේ" තුල කිසිදු කාලතුවක්කු ප්‍රහාරයක් සම්බන්ධයෙන් හමුදාව වගනොකියන බවට හමුදා ප්‍රකාශක බ්‍රිගේඩියර් උදය නානායක්කාර පැවසුවේ මෙසේ කියාපාමිනි: "දැන් අපි ෂෙල් පාවිච්චි කරන්නේ වත් නැහැ. දැන් තියෙන්නෙ ගෙයින්-ගෙට, වීදියෙන්-වීදියට කෙරෙන සටනක්. කාලතුවක්කු පාවිච්චි කරන්නෙත් නැති තරම්."

එහෙත්, පෙරදී මෙන්, ෂෙල් ප්‍රහාරවලින් සිදුවන මරන සම්බන්ධයෙන් එල්ටීටීඊයට දොස් පැවරීම හමුදා ප්‍රකාශකට දැන් කල නොහැකිය. තමන් එල්ටීටීයේ සියලු "සම්ප්‍රදායික සටන් හැකියාවන්" සඵල ලෙස නිහඬ කර ඇතැයි හමුදාව මේ සතිය මුල දී කියාපෑවේය. හමුදාව පුදුකුඩියුරුප්පු නගරය අල්ලාගෙන එල්ටීටීඊය වර්ග කිලෝමීටර් 47ක ප්‍රදේශයකට සීමා කර ඇතැයි ආරක්ෂක අමාත්‍යංශය සඳහා නිවේදනය කලේය.

ආරක්ෂක අමාත්‍යංශයේ නිවේදන හෝ තෝරාගත් මාධ්‍යවේදීන් වෙනුවෙන් විටින්විට සංවිධානය කෙරෙන ප්‍රදර්ශන චාරිකා හැරුනු කොට යුද බිමේ සිට කෙරෙන කිසිදු ස්වාධීන වාර්තාකරනයක් නැත. ඝාතන, පැහැරගැනීම්, මරන තර්න සහ මාධ්‍ය සංවිධානවලට එල්ල කෙරෙන ප්‍රහාර හරහා, මිලිටරියට සම්බන්ධිත ඝාතක කල්ලි, මාධ්‍ය තුල පවතින යුද්ධය පිලිබඳ ඇල්මැරුනු විවේචන පවා නිහඬ කර තිබේ.

ජාත්‍යන්තර විවේචන අපසරනය කිරීමේ ප්‍රයත්නයක් ලෙස, කොටුවී සිටින සිවිල් ජනයා වෙනුවෙන් "ආරක්ෂිත මාර්ග" දෙකක් විවෘත කරන බව, ශ්‍රී ලංකා ආන්ඩුව සිකුරාදා නිවේදනය කලේය. ජනාධිපති මහින්ද රාජපක්ෂගේ සභාපතිත්වයෙන් යුක්ත ජාතික ආරක්ෂක මන්ඩල රැස්වීමක දී එම තීන්දුව ගත් බවට වාර්තා විය. එලෙස මාර්ග විවෘත කිරීම එල්ටීටීඊය සමග මොන යම් හෝ සටන් විරාමයක් අදහස් නොකරන බවට විදේශ ලේකම් පාලිත කොහොන අවධාරනය කලේය.

කුහකත්වය හුස්ම හිරවන ආකාරයෙන් ප්‍රදර්ශනය කරමින්, මානව හිමිකම් ඇමති මහින්ද සමරසිංහ මේ අවස්ථාවේ ජිනීවා නුවර පැවැත්වෙන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මන්ඩලයේ රැස්වීමකට සහභාගි වෙමින් සිටී. ආන්ඩුව මානව හිමිකම් උල්ලංඝනය නොකරන බවත් එල්ටීටීඊයේ ග්‍රහනයෙන් "දෙමල ජනතාව මුදාගැනීමට" උත්සාහ දරන බවත් ඔහු කියාපෑවේය.

එල්ටීටීයේ පාලනය යටතේ පවතින ඇකිලෙන භූමි ප්‍රදේශය තුල තවමත් කොටුවී සිටින්නේ සිවිල් වැසියන් 70,000ක් පමනක් යයි ආන්ඩුව කියාපායි. කෙසේවෙතත්, අයිසීආර්සී තක්සේරුව 150,000 හා 200,000 අතර සංඛ්‍යාවකි. ප්‍රදේශයෙන් පලා ආ 37,000ක් පමන වන සිවිල් වැසියෝ, මිලිටරිය විසින් වවුනියාවේ ඉඳිකරනු ලැබ ඇති දැවැන්ත කඳවුරු තුල බලහත්කාරයෙන් රඳවා ගෙන සිටිති.

ඔවුන්ගේ පාර්ශ්වයෙන්, එල්ටීටීඊය අයිසීආර්සී මෙහෙයවීමෙන් කෙරෙන සිවිල් ජනයා ඉවත් කරගැනීමේ වැඩකටයුතුවලට සහාය දීම ප්‍රතික්ෂේප කර ඇත. පවතින භයංකර කොන්දේසි නොතකා සිවිල් ජනයාට එහි රැඳී සිටීමට අවශ්‍යව ඇතැයි තිලීපන් ලෙස හඳුන්වාගත් එල්ටීටීඊ ප්‍රකාශකයෙක් ඕස්ට්‍රේලියාවේ විශේෂ ගුවන් විදුලි සේවයට පැවසීය. "මේ මිනිස්සු අයිති මේ භූමියට. ඉතින් ඇයි ඔවුන්ට මෙම ප්‍රදේශවලින් පිටවීමට අවශ්‍ය?" යයි ඔහු පැවසීය. "මහා පරිමානයෙන් ජනයා ඉවත් කරගැනීමක් කොහෙත්ම අවශ්‍ය නැහැ."

රාජපක්ෂ තන්ත්‍රය මානුෂීය ව්‍යසනය සම්බන්ධයෙන් මූලික වගකීම දරයි යන්න පිලිබඳ කිසිදු සැකයක් නැත. ඉතිරිව පවතින එල්ටීටීඊ හට පිරිස් සමූලඝාතනය කරනු පිනිස නිදහසේ ප්‍රහාර එල්ලකල හැකි කලාපයක් නිර්මානය කරගනු වස්, සියලු සිවිල් ජනයා ප්‍රදේශයෙන් පලවා හැර සිර කඳවුරුවලට ගාල්කරගැනීමේ අභිප්‍රායෙන් යුක්තව ශ්‍රී ලංකා මිලිටරිය කටයුතු කරයි. දෙමල සරනගතයන් පසුවන්නේ, ආන්ඩුවේ හමුදා

විසින් සිදු කරන පලිගැනීම්, වධබන්ධන හා සිරගත කිරීම් පිලිබඳ යුක්තියුක්ත භීතියකිනි.

එහෙත් ජාත්‍යන්තර ආධාර ඒජන්සි වෙතින් ලැබෙන ඒවා ද ඇතුලු ස්ථානයේ සිට ලැබෙන වාර්තාවන්ට අනුව, සිවිල් වැසියන් යුද කලාපයෙන් පලායාම වැලැක්වීමේ උත්සාහයක එල්ටීටීඊය යෙදී සිටී. එහි ඉදිරිදර්ශනය වන්නේ, සටන් විරාමයක් සඳහා ශ්‍රී ලංකා ආන්ඩුව මත පීඩනය දමනු පිනිස ජාත්‍යන්තර බලවතුන්ට කරන සිය ආයාචනාවල දී ඉත්තන් ලෙස කොටුවූ සිවිල් ජනයා යොදාගැනීමයි. එල්ටීටීඊ-පාලිත ස්වතන්ත්‍ර කලාපයකට ඉඩ දෙනු ඇති, බටහිර බලවතුන්ගේ මැදිහත්වීමෙන් සංවිධානය කෙරෙන, සම්මුතියක් පිලිබඳව තවමත් බලාපොරොත්තු තබාගෙන සිටින එල්ටීටීඊය, සිය අරමුන සාක්ෂාත් කරගනු වස් සිවිල් ජනයාගේ ජීවිත බිලිදීමට බොහෝ සෙයින් සූදානම්ව සිටී.

කෙසේවෙතත්, ඉන්දියාව, එක්සත් ජනපදය, යුරෝපා සංගමය හා ජපානය වැනි මහ බලවතුන්ගේ මැදිහත්වීමක් මත බලාපොරොත්තු රැඳවීමේ එල්ටීටීඊයේ ඉදිරිදර්ශනය ද බිඳ වැටී ඇත. මෙම සියලුම ආන්ඩු, දකුනු ආසියාව පුරා සිය අවශ්‍යතාවන්ට බලපාන අස්ථායිකරන ගැටුමක් අවසන් කිරීමේ බලාපොරොත්තුවෙන් රාජපක්ෂ ආන්ඩුවේ යුද්ධයට පිටුබලය සපයා ඇත.

පසුගිය සතියේ දී, යුද කලාපය තුල සිවිල් ජනයා මුහුන පාන "වැඩෙන දුක් වේදනා" සම්බන්ධයෙන් එල්ටීටීඊයට දොස් පවරමින්, ඔබාමා පාලනාධිකාරය ශ්‍රී ලංකා තන්ත්‍රය පිටුපස විවෘතව පෙලගැසුනි. එක්සත් ජනපද සහකාර රාජ්‍ය ලේකම් රිචඩ් බව්චර්, සිවිල් ජනයාට පලා ඒමට ඉඩ දෙන ලෙස ද ආන්ඩුව විසින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති ආරක්ෂිත කලාපයේ සිට පිටතට ෂෙල් හා තුවක්කු ප්‍රහාර නතර කරන ලෙස ද එල්ටීටීඊයෙන් ඉල්ලා සිටිමින්, ශ්‍රී ලංකා මිලිටරියේ ප්‍රචාරය ප්‍රතිරාවය කලේය.

© www.wsws.org